සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විහාගය

I පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන
"අදිති"

4

පැය 01 යි

විහාග අංකය ..............................

**විහාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විහාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විහාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත රූප සටහන පිළිබඳ කිව හැකි නිවැරදි ම ප්‍රකාශය කුමක් ද?




i) අතීතයේ පමණක් භාවිත කරන ලදී.

ii) විදුලියෙන් ක්‍රියාත්මක වේ.

iii) වර්තමානයේ දී ඇතැම් විට භාවිත වේ.

02. පහත රූප සටහන අනුව මාළුවෙකු ට හා දියකාවෙකු ට සිටිය හැකි ස්ථාන දෙක වන්නේ,





i) B හා A

ii) C හා D


iii) A හා D

03. පහත කොටුව තුළට ඇතුළත් කිරීමට වඩාත් ම ගැළපෙන පිළිතුර කුමක් ද?






i) නූට්ටා



ii) ඉබ්බා



iii) හූනා

04. පහත රූපය සෑදීමට අවශ්‍ය ම කොටස තෝරන්න.





i)



ii)



iii)


05. නදෙව් සෑම වසර 3කට වරක් ම ඉන්දියාවේ යයි. දීමන්ත සෑම වසර 4කට වරක් ම සිංගප්පූරු යයි. දෙදෙනාම 2025 වසරේ තම ගමන ගියේ 10 වන වතාවට නම්, නදෙව් 04වන වතාවටත් දීමන්ත 05 වතාවටත් පිටරට ගිය වසරවල් පිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.

i) 2008/2006 ii) 2007/2005 iii) 2006/2007

06. වෙළෙඳෙක් අඹ ගෙඩි 6ක් රු65.00ට ගෙන ගෙඩි 4ක් රු65.00 විකුණති. වෙළෙන්දාට රුපියල් 650ක ලාභයක් ගැනීම ට විකිණීමට යුතු අවම අඹ ගෙඩි ගණන සොයන්න.


i) 10 ii) 12 iii) 120

07. පහත දැක්වෙන අවස්ථා නිවැරදි අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.


A


B


C


D



E

i) AECDB    ii) AECBD    iii) CBAED

08. කෙවින් ඡායා රූපයක් පෙන්වා කියා සිටියේ මේ ඡායා රූපයේ සිටින අය මගේ එකම අක්කා වන කිත්මාගේ පියා නොවන බවත්, නමුත් මෙම ඡායා රූපයේ සිටින අය අප දෙදෙනාට ම පුතා දුව ලෙස කතා කරන බවත් ය. එසේ නම් මෙම ඡායා රූපයේ සිටින්නේ,

i) මාමා    ii) සීයා    iii) අම්මා

09. පහත දක්වා ඇත්තේ පියන නොමැති කාඩ් බෝඩ් පෙට්ටියකි. එහි දිග පළල උස $1cm$ වන කුඩා ගණක හිස්තැන් නොමැති ව සම්පූර්ණයෙන් ම අසුරා ඇත. මෙම කාඩ් බෝඩ් පෙට්ටියේ නොගෑවී ඇති ගණක ගණන සොයන්න.





i) 12

ii) 18

iii) 24

- **පහත දැක්වෙන්නේ පාසලේ දළ සැලැස්මකි. ඒ ඇසුරින් 10-11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




10. තරිඳු පාසල ආරම්භ වීමට පෙර ප්‍රධාන ගේට්ටුවෙන් පාසලට ඇතුළුවන විට වම් අත දෙසින් ඉර පායා එනු පෙනුණි. ඒ අනුව පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න.

i) ක්‍රීඩා පිටියට උතුරින් කාර්යාලය පිහිටා ඇත.


ii) ක්‍රීඩා පිටියට ඊසාන දිශාවෙන් බුදු මැදුර පිහිටා ඇත.

iii) ප්‍රධාන ගේට්ටුවට උතුරින් පුස්තකාලය පිහිටා ඇත.

11. A නැමති ලක්ෂයේ සිට බස්නාහිර දෙසට හැරී සිටි සදෙව් තම දකුණු අත පැත්තට වට කාලක් කැරකී වෙන කිසිම දිශාවකට නොහැරී පහසුවෙන් ම ගමන් කළ හැකි දේ වන්නේ,

i) ගේට්ටුවෙන් පිටතට යාම ii) බුදු මැදුරට යාම iii) ක්‍රීඩා පිටියට යාම

12. රූපයේ අඳුරු කර ඇති කොටස මුළු කීයෙන් පංගුවක් ද?




i) $\frac{1}{8}$

ii) $\frac{1}{6}$

iii) $\frac{1}{12}$

13. කඩදාසියක් කිහිපවරක් නවා එක් කතුරු පහරකින් කපා පහත හැඩතලය ලබා ගෙන ඇත. එම හැඩතලය ලබා ගැනීම ට කඩදාසිය නැමිය යුතු අවම වාර ගණන සොයන්න.



i) 2 වරක්

ii) 3 වරක්

iii) 4 වරක්

14. දීසදිගේ ඔරලෝසුව සෑම විට ම පැයක් වැඩියෙන් වේලාව පෙන්වයි. ඈ උදෑසන 3.50ට නිවසින් රැකියාවට යාම ට පිටත් විය. රැකියාවට ගොස් එම ආයතනයේ වේලාව බලන විට එහි වෙලාව සටහන් වී තිබුණේ පෙ.ව.9.05 ලෙස ය. ඇයගේ ගෙදර ඔරලෝසුව ඇයට පෙනී තිබුණේ කැඩපතකින් නම් ඇයට නිවසේ සිට සේවා ස්ථානයට යාමට ගත වූ කාලය සොයන්න.

i) මිනිත්තු 55 ii) පැය 1 මිනිත්තු 55 iii) පැය 5 මිනිත්තු 15

15. සෙනුදි මල් 10ක් කඩන විට ඬේනුලි මල් 8ක් කඩයි. ඬේනුලි මල් 4ක් කඩන විට සිනුරි මල් 7ක් කඩයි. ඒ අනුව වැඩිම වේගයෙන් ම මල් කඩන්නේ,

i) සෙනුදි ii) සිනුර iii) ඬේනුලි

16. එක සමාන කාඩ්පත් 12ක් ඇත. එහි 1-9 තෙක් ඉලක්කම් යොදා ඇත. එක ඉලක්කමක් අවම ය එක් වතාවක් හෝ යොදා ඇත. එම කාඩ්පත්වල තැබිය හැකි උපරිම අගය වන්නේ,


i) 72 ii) 58 iii) 55

17. '***වෛතාලව හිරු දෙවියෝ***
***කන්ද උඩින් නැග එනවා***
***වෙල් යායට කහ රෙද්දක්***
***පෙරෙව්වා වගෙයි'***

ඉහත කවියේ **වෛතාලව** ලෙස හඳුන්වන්නේ,

i) හිමිදිරිය ii) කරත්තය iii) වැව

- **පහත දැක්වෙන රූප දෙස බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**





18. අන්නාසි ගෙඩියක මිල කීය ද?
    i) රු. 15.00 ii) රු. 13.00 iii) රු. 19.00

19. ඉහත තොරතුරු අනුව අන්නාසි ගෙඩි 5 හා දොඩම් ගෙඩි 5ක මිල සොයන්න.
    i) රු. 140.00 ii) රු. 139.00 iii) රු. 150.00

20. මනුදිට බෙහෙත් පෙති 5ක් මිනිත්තු පහෙන් පහට බීමට සිදුවිය. එම බෙහෙත් පෙති 5 බීම පෙරවරු 6.00 ආරම්භ කරන ලදී. බෙහෙත් බීම ට ගත වූ කාලය සොයන්න.
    i) මිනිත්තු 15 ii) මිනිත්තු 20 iii) මිනිත්තු 25

- **ඔමෙත් පෙරවරු 6.00 ට A සිට B දෙසට ගමන් අරඹා පැයකට පසු නෙතුම් B සිට A දෙසට ගමන් ආරම්භ කරයි. ඔමෙත්ගේ වේගය පැයට කිලෝමීටර 20කි. නෙතුම්ගේ වේගය පැයට කිලෝමීටර 10කි.**






21. එකිනෙකට මුහුණට මුහුණ මුණ ගැසෙන්නේ ඕමෙත් ගමන අරාම්භ කර පැය කීයක ට පසු ද?
    i) පැය 6.00කට පසු ii) පැය 7.00කට පසු iii) පැය 8.00කට පසු


22. නෙතුම් ගමන් අරාම්භ කර පැය අටක දී මෙම දෙදෙනා අතර දුර කොපමණ ද?
    i) $60km$ ii) $80km$ iii) $100km$


23. සමනළී එක සමාන ඉරටු කැබලි කිහිපයක් හා තිබ්බටු ගෙඩි කිහිපයක් යොදාගෙන ඝන වස්තු දෙකක් සාදන ලදී. මේ සඳහා ඉරටු කැබලි 18ක් හා තිබ්බටු ගෙඩි 12ක් යොදා ගත්තේ නම් සදාන ලද ඝණවස්තුව විය හැක්කේ,
    i) ඝනකය/ඝනකාභය ii) චතුස්තලය/ඝනකාභය iii) චතුස්තලය/ඝනකය

24. දී ඇති හැඩය උපයෝගී කරගෙන ඝනකයක් සෑදූ විට දිස්වන ආකාරය තෝරන්න.




i)



ii)




iii)


25. සිතුලි තම වත්ත වටා වැටක් ගැසීමට තීරණය කරන ලදී. වත්තේ දිග, පළල මෙන් දෙගුණයකි. එහි මීටර පහෙන් පහට කණු සිටුවන ලදී. සිටුවන ලද මුළු කණු ගණන 48ක් නම් එහි පළල පැත්තක දිග සොයන්න.

i) $40m$ ii) $35m$ iii) $45m$

❖ වර්ණ හයකින් යුක්ත පෙට්ටි හයක් එකමත එක සිටින සේ ගොඩ ගසා ඇත.

- කොළ පාට පෙට්ටිය යට ම හෝ උඩ ම පෙට්ටිය නොවේ.
- යට සිට හතරවන පෙට්ටිය නිල් පාට වේ.
- කහ හා රතු පෙට්ටි එක ළඟ පිහිටන්නේ නැත.
- නිල් පෙට්ටිය ඇත්තේ රතු හා රෝස පෙට්ටි අතර ය.




26. රෝස පාට හා තැඹිලි පාට පෙට්ටි පිහිටිය හැකි අංක වන්නේ,

i) 4 / 6 ii) 4 / 1 iii) 5 / 3

27. අංක පිළිවෙළට පෙට්ටි වල වර්ණ දක්වා ඇති පිළිතුර ලියන්න.

i) තැඹිලි/රතු/නිල්/ රෝස/ කොළ/කහ

ii) කහ/කොළ/රෝස/නිල්/රතු/තැඹිලි

iii) කොළ/රතු/නිල්/කහ/තැඹිලි/රෝස

28. යමාෂා හා චමත් අතර ළමයි 10 දෙනෙක් සිටිති. චමත් හා ඔනාරා අතර ළමයි 5 දෙනෙක් සිටිති. යාමෂා හා ඔනාරා අතර සිටිය හැකි අවම ළමයි ගණන විය හැක්කේ,

i) 4 ii) 16 iii) 18

29. ඉහත විස්තරයට අනුව එම පේළියේ සිටිය හැකි අවම ළමයි ගණන විය හැක්කේ,

i) 18 ii) 12 iii) 10

30. විහගි, ඔෂධ, නෙතු හා කෙවින් ළඟ යම් සමාන මුදල් ප්‍රමාණයක් තිබෙයි. විහගි සතු මුදල් ප්‍රමාණයක් රුපියල් 50ක් කෙවින්ට දෙයි. ඔෂධ සතු මුදලින් රුපියල් 40ක් විහගිට ද, රු10ක් කෙවින්ට ද දෙන ලදී. කෙවින් සතු මුදලින් රුපියල් 30ක් නෙතුට දුන් අතර කෙවින් ළඟ ඉතිරි ව තිබූ මුදලින් රුපියල් 10ක් ඔෂධ ට ද, නෙතු සතු මුදලින් රුපියල් 50 විහගිට ද දෙන ලදී. එසේ ලබා දීමෙන් පසු වැඩිම මුදලක් ඇත්තේ කා ළඟද?

i) විහගි ii) නෙතු iii) කෙවින්

31. ඉහත මුදල් ප්‍රමාණ ලැබීම අනුව අඩු බවේ සිට වැඩි බවට පෙළ ගස්වූ විට නිවැරදි පිළිවෙළ වන්නේ,

i) විහගි/ කෙවින්/ නෙතු/ ඔෂධ


ii) කෙවින්/ විහගි/ ඔෂධ/නෙතු

iii) ඔෂධ/නෙතු/කෙවින්/විහගි

- **පහත දැක්වෙන ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි නොවන පිළිතුර තෝරන්න.**

32. i) ඕනෑම ඝණවස්තුවකට පෘෂ්ඨ එකක් පිහිටයි.
    ii) සෑම ත්‍රිකෝණයක ම දිගින් වැඩිම පාදයට වඩා අනෙක් පාද දෙකේ දිගේ එකතුව දිගින් වැඩි විය යුතුය.
    iii) සමචතුරස්‍රයක ඇඳිනු ලබන සමමිතික රේඛා දිගින් සමානයි.

33. පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.




1. චනුමිගේ වම් අතින් සනල්‍යා අල්ලාගෙන සිටී.
2. සනල්‍යාගේ වම් අතින් බිනුලි අල්ලාගෙන සිටී.
3. චතුරි පෝලිමේ කෙළවරක සිටී.
4. චනුමිගේ වම් අත පැත්තෙන් දෙදෙනක් පමණක් සිටින අතර චතුරි ඒ අතර නොසිටී.

මේ අනුව විදුමිණි සිටිය හැකි ස්ථානයේ අංක වනුයේ,

i) 2     ii) 3     iii) 4

34. පහත සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න.

1988 → 1182432

1981 → 118244

2014 → ............


i) 20316     ii) 20410     iii) 22316

35. වට්ටියක අරලිය මල් 5ක් ද, සල් මල් 6ක් ද, නාමල් 3ක් ද තිබෙයි. එසේ නම් නිවැරදි කියමන වන්නේ,
    i) ඉහත සියලුම මල් සුදු පාටය.
    ii) සෑම මලකට ම පෙති හතරක් තිබෙයි.
    iii) සෑම මලකම පෙති පහක් තිබෙයි.

36. පහත දැක්වෙන සංඛ්‍යාවල ඇති ඉලක්කම් වලින් නිරූපිත අගය හා ස්ථානීය අගය එක ම වන සංඛ්‍යාව තෝරන්න.

i) 4321     ii) 100101     iii) 1111

37. බඹර කැපීමට ගිය මිතුරන් දෙදෙනෙකුට ලැබුණු බඹර පැණි ප්‍රමාණය $8l$ කි. එය දෙදෙනා අතර බෙදා ගැනීමට ඔවුන් සතුව තිබුනේ පහත ලබු කැට තුන පමණි. මෙම ලබු කැට ආධාරයෙන් පැණි සමානව බෙදා ගැනීමට,





i) හැකිය. ii) නොහැකිය. iii) ස්ථිරව ම කිව නොහැකි ය.

38. සංවර්ධන කටයුත්තක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම 2020 මුලදී ආරම්භ කරන ලදී. මෙය හරියට ම අවුරුදු 4කින් අවසන් කළේ නම්, එය අවසන් කරන ලද්දේ,

i) 2024 වර්ෂයේ මුල දී ii) 2023 වර්ෂ අවසානයේ දී iii) 2023 වර්ෂයේ මුල දී

39. පහත දැක්වෙන්නේ දෝෂ සහිත තරාදියක් ආධාරයෙන් ද්‍රව්‍ය කීපයක් කිරා ගත් ආකාරයයි.




ඉහත රූපය අනුව ☯ මෙම රූපයේ අගය වන්නේ,

i) $20kg$ ii) $10kg$ iii) $30kg$

40. ටැංකියක් පිරවීමට ABC ලෙස ජල කරාම තුනක් සවි කර ඇත. A ජල කරාමයෙන් ජලය සම්පූර්ණයෙන් පිරවීමට පැය 4ක් ගත වේ. B ජල කරාමයෙන් සම්පූර්ණයෙන් පිර විමට පැය 6ක් ගත වේ. C ජල කරාමයෙන් සම්පූර්ණයෙක් ජල පිරවීමට පැය 12ක් ගත වේ. මේ කරාම 03ම එක වර විවෘත කළේ නම් ටැංකිය පිරවීමට ගතවන කාලය සොයන්න.

i) 2 ii) 4 iii) 5